# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2017.06.23
වේලාව : පෙ.ව. 9.30
ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත.

## සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :

| | | | |
|---|---|---|---|
| 1) | එම්.ඒ.බී. දයා සෙනරත් මයා. | - | ප්‍රධාන ලේකම් (බ.ප) |
| 2) | පී. සෝමසිරි මයා. | - | ආණ්ඩුකාර ලේකම් (බ.ප) |
| 3) | එම්.ජී.ඒ.තිලකරත්න මයා. | - | ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප) |
| 4) | හේමන්ත සමරකෝන් මයා. | - | සභා ලේකම් (බ.ප) |
| 5) | චන්ද්‍රානි සමරකෝන් මිය. | - | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප) |
| 6) | එස්.ජී.විජයබන්ධු මයා. | - | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප) |
| 7) | එම්.කේ.කේ.ආර්.අබේදීර මිය. | - | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය(බ.ප) |
| 8) | එන්.නිල්වල මයා. | - | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප) |
| 9) | එච්.ජී.ජී.ජේ.ධර්මසේන මයා. | - | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප) |
| 10) | ඩබ්ලිව්.එම්.දයාවතී මිය. | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 11) | සිරිසෝම ලොකුවිතාන මයා. | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 12) | ඩී.එම්.එන්.දිසානායක මිය. | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 13) | ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ මයා. | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 14) | කේ.එන්.සූරියආරච්චි මිය. | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |

**ලේකම්වරුන් විසින් පහත කරුණු පිළිබඳ ව සාකච්ඡා කළ අතර, පහත දක්වා ඇති තීරණයන් ට එළඹෙන ලදී.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් සභා කාර්යාල එක ම භූමියක ස්ථාපිත කිරීම. | බත්තරමුල්ල නව පරිශ්‍රයේ සිට 400m පමණ දුරින් පිහිටා ඇති කොස්වත්ත ප්‍රධාන මාර්ගයට මායිම්ව පවතින අක්කරයක පමණ වන ඉඩම රජ වාහන ගාල් කිරීම සඳහා ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු විය. එහි දී රජයේ තක්සේරු වටිනාකම කොපමණ වේ දැයි සොයාබැලිය යුතු බව ද සාකච්ඡා විය. | සභා ලේකම් සහ කමිටු සාමාජිකයින්.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු). |
| 02. | නිල නිවාස පිළිබඳ කාර්ය සාධන බලකාය සහ සංචාරක බංගලා ඉදි කිරීම | පළාත් සභා නිලධාරීන් සඳහා නිල නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට යෝජිත, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ඉඩමේ අක්කර 7 සඳහාම ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීම හා අවශ්‍ය තොරතුරු ලබාගෙන සාකච්ඡාවක් පවත්වා එම ව්‍යාපෘතිය ආරම්භ කිරීම කළ යුතු බව ද තීරණය විය.<br><br>සංචාරක බංගලා ඉදිකිරීම සඳහා කතරගම, නුවරඑළිය යන ප්‍රදේශ වල ඉඩම් හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස ප්‍රධාන ලේකම් දන්වන ලද අතර, නුවරඑළිය සංචාරක බංගලා ඉදිකිරීමට තෝරාගත් ඉඩමේ තක්සේරු කටයුතු සඳහා මධ්‍යම පළාත් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>අනුරාධපුර ප්‍රදේශයේ සංචාරක බංගලා සඳහා ඉඩමක් සම්බන්ධව උතුරුමැද පළාත් ප්‍රධාන ලේකම්ගෙන් විමසීමක් කිරීම. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන). |
| 03. | සංවර්ධන වැඩසටහන් සහ ප්‍රගති සමාලෝචනය. | එක් එක් අමාත්‍යාංශ මඟින් මේ වන විට ලබා ඇති ප්‍රගතිය නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් විස්තර කරන ලදී. මුළු ව්‍යාපෘති වලින් 100%ක් අවසන් කර ඇති ව්‍යාපෘති 9ක් ද, ක්‍රියාත්මක අවධියේ පවතින ව්‍යාපෘති 53ක් සහ මූලික වැඩකටයුතු අවසන් කළ ව්‍යාපෘති 18ක් ද, පවතින බව මෙහි දී වැඩිදුරටත් පෙන්වා දෙන ලදී.<br><br>අතිගරු ජනාධිපතිතුමාගේ සංවර්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සියල්ලේ ඡායාරූප සහ විස්තර ඇතුළත් ප්‍රගතිය කඩිනමින් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආණ්ඩුකාරතුමා සහ ජනාධිපති ලේකම් වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

| | | | |
|---|---|---|---|
| 04. | භාෂා ප්‍රතිපත්තිය, තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් නිල වෙබ් අඩවි යාවත්කාලීන කිරීම. | පළාත් වෙබ් අඩවි නිරීක්ෂණය කිරීමේ දී මේ වන විට යම් ප්‍රගතියක් පවතින බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. මෙම වෙබ් අඩවි සියල්ල එකවර එළි දැක්වීමට අපේක්ෂා කරන බැවින්, 2017 ජූලි මස 31 දිනට පෙර ITRDI ආයතනය වෙතින් දින ලබා ගෙන එම ආයතනයේ නියෝජිතයකු අමාත්‍යාංශය වෙත ගෙන්වා ගෙන වෙබ් අඩවි සකසා නිම කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 05. | තොරතුරු තාක්ෂණය මඟින් සේවා වැඩිදියුණු කිරීම. | බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා වන බඳවා ගැනීම් පටිපාටියේ අඩුපාඩු මේ සතිය වන විට අවසන් කර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම. මෙම සේවාවන් බහිස්සේවාර්ථනය (Outsourcing) කිරීම නිසා විශාල මුදලක් වැය වන බව ද පෙන්වා දෙන ලදි. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කමිටු සාමාජිකයින්. |
| 06. | වෙනිවැල්කොල ව්‍යාපෘතියට අයත් අත් කඩදාසි යන්ත්‍ර කොලොන්නාව කසල අංගනයට බැහැර කිරීම. | ගිණුම් කාරක සභා උපදෙස් පරිදි නැවත මූලික විමර්ශනය පැවැත්වීමේ කටයුතු ආරම්භ කර ඇති බව අමාත්‍යාංශ ලේකම් ප්‍රකාශ කරන ලදි.<br>ඒ සඳහා කල් ඉල්ලා ගිණුම් කාරක සභා ලේකම් වෙත ලිපියක් ඉදිරිපත් කරන ලෙස ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශ ලේකම් වෙත දන්වන ලදී. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය. |
| 07. | පළාත් සභාව තුල විමර්ශන නිලධාරි සංචිතයක් ඇති කිරීම. | පළාත් සභාව තුල මූලික විමර්ශන සිදු කිරීම සඳහා පිහිටුවන ලද 50 දෙනෙකුගෙන් යුත් විමර්ශන නිලධාරි සංචිතය පුහුණුවීම් සඳහා යොමු කර අවසන් බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) විසින් ප්‍රධාන ලේකම් වෙත දන්වා සිටින ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 08 . | ඔලියමුල්ල මහා විද්‍යාලයේ ඉදිකිරීම සම්බන්ධව. | ඔලියමුල්ල මහා විද්‍යාල භූමියේ ඉදිකිරීම් සම්බන්ධව දැනට උද්ගතව ඇති දේශපාලනමය ගැටලුව සඳහා විසඳුමක් ලෙස, වර්තමාන තත්ත්වය පිළිබඳ වාර්තාවක් සකසා ආණ්ඩුකාරතුමා මඟින් හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය වෙත වාර්තා කිරීම සුදුසු බව තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 09. | ගරු ආණ්ඩුකාරතුමාගේ නිල නිවස ඉදිකිරීම. | භූමිය සකස් කිරීමෙන් අනතුරුව ෆයිල්ස් ගැසීම් කටයුතු ආරම්භ කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

| | | | |
|---|---|---|---|
| 10. | මෙත් සෙවන රජයේ නිවර්තන නිවාසය පිහිටි ඉඩම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට පැවරීම. | මෙත් සෙවන ආයතනය සන්ෆ්ලවර් විලේජ් වෙත ගෙන යාමට අදාළ කටයුතු සම්බන්ධයෙන් 2017.06.06 දින පළාත් ආදායම් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ දී සාකච්ඡාවක් පැවැත්වූ අතර, 2017.06.13 වන දින ස්ථානීය පරීක්ෂණයක් ද සිදු කරන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත දැනට මෙත් සෙවන ආයතනය පිහිටි ඉඩමෙන් කොටසක් හෝ කඩිනමින් ලබා දීමට හා අවශ්‍ය කටයුතු කිරීමට එම සාකච්ඡාවේ දී තීරණය කර ඇති බවත්, සන්ෆ්ලවර් විලේජ් පිහිටි ඉඩම විධිමත්ව පවරා ගැනීම හා ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කෙරෙමින් පවතින බවත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රධාන ලේකම් වෙත දන්වන ලදී.<br><br>අද දිනයේ ද මේ පිළිබඳ රැස්වීමක් පැවැත්වීමට නියමිත බැවින් එහි දී මේ සම්බන්ධව තීරණය ගැනීම සිදු කරන බව ප්‍රධාන ලේකම් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය. |
| 11. | දරුවන් සුරකිමු ජාතික වැඩසටහන 2017-2019 | මෙම වැඩසටහන සම්බන්ධව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ප්‍රගතිය විමසා ඇති බැවින්, සියලු අමාත්‍යාංශ කැඳවා 2017 ජූලි 04 වන දින ප්‍රගතිය සාකච්ඡා කරන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් දැනුම් දෙන ලදී.<br><br>පාසල් සඳහා අනුයුක්ත කරන ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් ද මේ සඳහා යොදවා ගැනීම කෙරෙහි අවධානය යොමු විය. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය.<br><br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය. |
| 12. | වකුගඩු රෝග නිවාරණ ජාතික සැලැස්ම සහ මත්ද්‍රව්‍ය | ජූලි මස 11 වන දින පෙ.ව.9.00 ට වකුගඩු රෝග නිවාරණය සම්බන්ධව ප්‍රගති සමාලෝචන වැඩසටහනක් පැවැත්වීමටත් එහි දී එක් එක් අමාත්‍යාංශ වෙත පවරන ලද කටයුතු වල ප්‍රගතිය ද සමඟ සහභාගී වන ලෙසත් දැනුම් දෙන ලදී.<br><br>පාසල් සඳහා අනුයුක්ත කරන ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් මේ සඳහා යොදවා ගැනීමට ද තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය. |

## <u>නව යෝජනා</u>

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ සිට සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට පත් කිරීම මත අඩු වැටුපක් ලැබීම. (GOS/ADM/5/16/(VII) හා 2017.06.16 දිනැති ලිපිය) | ඌන සේවා උපාධිධාරී පත්වීම් පදනම මත සංවර්ධන නිලධාරී සේවයට බඳවා ගන්නා ලද කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් ඉහළ වැටුප් තලයක පිහිටුවීම පවතින නීති අනුව සිදු කළ නොහැකි බව තීරණය කරන ලදී. | ආණ්ඩුකාර ලේකම්. |

| | | | |
|---|---|---|---|
| 02. | විනය කටයුතු ක්‍රමවත් ව ඉටු කිරීම, හදිසි අනතුරු වන්දි ලබා දීම හා කොමිෂන් සභාව වෙත නිර්දේශයන් ලබා දීමේ ක්‍රමවේදය (WPC/PSC/ADM09/11 හා 2017.06.16) | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලිපි ඉදිරිපත් කිරීමේ දී අවධානය යොමු කල යුතු කරුණු සියලුම අමාත්‍යාංශ වෙත දන්වා යැවීමට ප්‍රධාන ලේකම් උපදෙස් ලබා දෙන ලදි. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභ්‍යන්තර දුරකථන පද්ධතියක් සකස් කිරීම සම්බන්ධව ද සාකච්ඡා විය.<br><br>මෙතෙක් අවසන් කර නොමැති බඳවා ගැනීම් පටිපාටි පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) විසින් දැනුම් දෙන ලදි.<br>ඒ අනුව, බඳවා ගැනීම් පටිපාටි පිළිබඳ ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීමක් 2017.07.11 දින පෙ.ව11.00ට සංවිධානය කිරීම. | ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 03. | ඩෙංගු මර්දන ජාතික ව්‍යාපාරය යටතේ ප්‍රගතිය වාර්තා කිරීම. | ජනාධිපති කාර්යාලය වෙත වාර්තාවක් යැවීම සිදු කළ යුතු බැවින්, සෑම මසකම අවසන් බදාදා දිනට පෙර ඩෙංගු මර්දන ජාතික ව්‍යාපාරය යටතේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් සිදු කරන ලද ප්‍රගතිය වාර්තා කරන ලෙස ප්‍රධාන ලේකම් දැනුවත් කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 04. | හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් සිදු වූ හානි පිළිබඳ තොරතුරු ලබා නොදුන් අමාත්‍යාංශය දැනුවත් කිරීම. | අධ්‍යාපන, පළාත් පාලන හා ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ හානි සිදු වූ ආයතන පිළිබඳ වාර්තා මේ වන විට ලැබී ඇති බව ප්‍රධාන ලේකම් වෙත ප්‍රකාශ කරන ලදි.<br>සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආපදා, හානි විපත් කඩිනමින් ප්‍රධාන ලේකම් වෙත වාර්තා කිරීම සිදු කරන ලෙසත් දැනුම් දෙන ලදි. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

....................................
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.